අ.පො.ස. සාමාන්‍ය පෙළ

කෘෂි හා ආහාර තාක්ෂණය - 10 ශ්‍රේණිය

උසස් සාමාර්ථයක් ලබාගැනීම උදෙසා සම්පාදිත

# කෙටි සටහන් අත්වැල

මහව අධ්‍යාපන කලාපය

2020

## නිපුණතාවය 01 - ශ්‍රී ලංකාවේ සංවර්ධනයට කෘෂිකර්මාන්තයේ දායකත්වය

- පෝෂණ අවශ්‍යතා සැපයීම.
- රැකියා නියුක්තිය
- විදේශ විනිමය ඉපැයීම.
- කාර්මික අංශයට අමුද්‍රව්‍ය සැපයීම.
- කාර්මික හා සේවා අංශය සඳහා වෙළඳපළ පුළුල් කිරීම.
- සංස්කෘතිය පෝෂණය

*ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයට ඇති විභව*

- සම්පත් සුලභ වීම.
- හිතකර වූ පරිසර තත්ත්ව පැවතීම.
- උපකාරක සේවා සැපයීම.
- දේශීය හා විදේශීය වෙළඳපළක් තිබීම.
- යටිතල පහසුකම් සැපයීම.

## නිපුණතාවය 02 - කෘෂිකාර්මික කටයුතු කෙරෙහි දේශගුණික සාධකවල බලපෑම්

*බෝග වගාවේදී වැදගත් වන දේශගුණික සාධක*

- වර්ෂාපතනය
- ආලෝකය
- සුළඟ
- උෂ්ණත්වය
- සාපේක්ෂ ආර්ද්‍රතාවය

*ලංකාවට වර්ෂාව ලැබෙන ක්‍රම*

- නිරිතදිග සහ ඊසානදිග මෝසම් වැසි
- සංවහන
- වාසුළි

*වර්ෂාපතන රටා සහ වගා කන්න*

| වැසි ලැබෙන ක්‍රම | වැසි ලැබෙන ප්‍රදේශ | වැසි ලැබෙන කාලසීමාව | වගාකරණය |
|---|---|---|---|
| පළමුවන අන්තර් මෝසම් වැසි | දිවයින පුරා | මාර්තු - අප්‍රේල් | යල කන්නය |
| නිරිතදිග මෝසම් වැසි | තෙත් කලාපය | මැයි - සැප්තැම්බර් | |
| දෙවන අන්තර් මෝසම් (සංවහන වැසි) | දිවයින පුරා | ඔක්තෝබර් - නොවැම්බර් | මහ කන්නය |
| ඊසානදිග මෝසම් වැසි | වියළි කලාපය | දෙසැම්බර් - පෙබරවාරි | මහ කන්නය |

## නිපුණතාවය 03 - පස


*පාෂාණවලින් පස නිර්මාණය වීමේ ක්‍රියාවලිය නම්,*

පාෂාණ —පාෂාණ ජීර්ණය→ මාතෘ ද්‍රව්‍ය —පාංශු ජනනය→ වේ.

පාංශු ජනනය මූලික වන පාෂාණ ඒවායේ සම්භවය අනුව,

- ආග්නේය පාෂාණ
- අවසාධිත පාෂාණ
- විපරිත පාෂාණ          ලෙස වර්ග කළ හැකිය.

පස මතුපිට සිට මවු පාෂාණය දක්වා පාංශු කලාප පෙන්නුම් කරන පසේ සිරස්කඩක් 'පාංශු පැතිකඩක්' නම් වේ.




*පසක අඩංගු විවිධ කොටස් එනම් 'පාංශු සංඝටක',*

- ඝන ද්‍රව්‍ය - පාංශු ඛනිජ සහ පාංශු කාබනික ද්‍රව්‍ය
- පාංශු වාතය
- පාංශු ජලය
- පාංශු ජීවීන්

*පස තුළ අඩංගු ජලය පවතින ආකාරය*

- ගුරුත්වාකර්ෂණ ජලය
- කේෂාකර්ෂණ ජලය
- ජලාකර්ෂණ ජලය

ශාකවලට අවශෝෂණය කරගත හැක්කේ කේෂාකර්ෂණ ජලයයි.

*පාංශු ලක්ෂණ*

- භෞතික ලක්ෂණ
- රසායනික ලක්ෂණ
- ජෛව ලක්ෂණ

*පාංශු ව්‍යුහය යනු,*

ස්වභාවික තත්ත්ව යටතේ පස් අංශු එකට එකතු වී සෑදී ඇති පස් සමූහනවල රූපාකාරය

*පාංශු ව්‍යුහ ආකාර*

- ස්ථම්භාකාර
- අණු කෝණාකාර
- කැටිති
- තනි කණිකා

| පසක ව්‍යුහය විනාශ වන ආකාර | පාංශු ව්‍යුහය ආරක්ෂා වන ආකාර |
|---|---|
| • එකම ගැඹුරට වැඩි වාර ගණනක් පස පෙරළීම.<br>• පාංශු ඛාදනය අධික වීම.<br>• සෝඩියම් ලවණ අධික වීම.<br>• ජල වහනය දුර්වල වීම. | • පාලනයක් සහිතව බිම් පෙරළීම.<br>• පාංශු සංරක්ෂණ හා පුනරුත්ථාපන ක්‍රම<br>• පසට කාබනික ද්‍රව්‍ය යෙදීම. |

*පාංශු හායනය යනු,*

අවිධිමත් කෘෂිකාර්මික කටයුතු ඇතුලු විවිධ මිනිස් ක්‍රියාකාරකම් හේතුකොටගෙන ඛාදනය ලක්වීමෙන් හෝ පාංශු භෞතික, රසායනික සහ ජෛව ගුණාංග වගාවට අයහපත් වීමෙන් පසේ බෝග නිෂ්පාදන ශක්තිය හීනවීමයි.

*පාංශු ඛාදනය යනු,*

යම් ස්ථානයක පිහිටි පස් පාංශු සමූහන හෝ අංශු ලෙස වෙන්වී වෙනත් ස්ථානයක් වෙත ගසාගෙන ගොස් තැන්පත්වීමයි.

*පාංශු ඛාදන ක්‍රියාවලියේ පියවර*

1. පස් අංශු දේහයෙන් <u>වෙන්වීම.</u>
2. වෙන් වූ පස් සමූහන හා පාංශු අංශු වෙනත් ස්ථානයකට <u>ගසාගෙන යාම.</u>
3. ගසාගෙන ගිය පාංශු කොටස් <u>වෙනත් ස්ථානයක තැන්පත් වීම.</u>

*පාංශු ඛාදන කාරක*

- වර්ෂා ජලය
- වේගවත් සුළඟ
- මුහුදු රළ සහ ගංගා රළ
- මිනිස් සහ සත්ව ක්‍රියාකාරකම්

*පාංශු ඛාදනයේ අහිතකර බලපෑම්*

- කෘෂි ඉඩම්වල වටිනාකම අඩුවීම.
- ගංගා සහ ජලාශ ගොඩවීම.
- ගංවතුර ඇතිවීම.
- ගස් ඇද වැටීම.
- ශාක වර්ධනයට සුදුසු පාංශු ස්ථානයේ ඝනකම අඩුවීම.

*පාංශු සංරක්ෂණ ක්‍රියාමාර්ග*

- ආවරණ බෝග වගාව
- සමෝච්ච රේඛා අනුව සීසෑම.
- සමෝච්ච රේඛා අනුව බෝග වගාව
- පාංශු ව්‍යුහය දියුණු කිරීම.
- පසට වසුන් යෙදීම.

*පාංශු පුනරුත්ථාපනය යනු,*

හායනයට ලක් වූ පසක් නැවත බෝග වගා කළ හැකි තත්ත්වයට පත්කිරීමයි.

මේ සඳහා පාංශු ඛාදනය අවම කිරීම (පස සංරක්ෂණය), පසෙහි හීන වූ භෞතික රසායනික හා ජෛව ලක්ෂණ දියුණු කිරීම කළ යුතු ය.

## නිපුණතාවය 05 - බිම් සැකසීම

*බිම් සැකසීමේ අරමුණු*

- පසෙහි භෞතික තත්ත්වය දියුණු කිරීම.
- පසෙහි ඇති ගල් මුල් ආදිය ඉවත් කිරීම.
- පලිබෝධ පාලනය
- පසට පොහොර මිශ්‍ර කිරීම.

*මූලික බිම් සැකසීම යනු,*

යම් කිසි බෝගයක් භූමියේ සංස්ථාපනය කිරීමට පෙර පස හා සම්බන්ධව සිදු කරන සියලුම ක්‍රියාකාරකම්

*මූලික බිම් සැකසීමේ ප්‍රධාන පියවර*

1. ප්‍රාථමික බිම් සැකසීම (උදළු සහ නගුල් වර්ග භාවිත කිරීම)
2. ද්විතීයික බිම් සැකසීම (උදළු සහ පෝරු වර්ග - කොකු නගුල, රේක්කය, රිජරය, භ්‍රමණ පෝරුව (රොටවේටරය))

*අතුරුයත් ගෑම යනු,*

බෝගයක් ක්ෂේත්‍රයේ සංස්ථාපනය කිරීමෙන් පසු පස සම්බන්ධව මිශ්‍ර කරනු ලබන විවිධ ක්‍රියාකාරකම් අතුරුයත් ගෑම නම් වේ.

*අතුරුයත් ගෑමේ උපකරණ* - උදැල්ල, හෝ වර්ග, අත් මුල්ලු, තුන් පුරුක් කල්ටිවේටරය, අත් ස්කෝප්පය, ජපන් රොටරි වීඩරය, ටූල්, කැරියර්


**නිපුණතාවය 06 - උස් බිම් බෝග සඳහා තවාන් ශිල්ප ක්‍රම**

*තවානක් යනු,*

රෝපණ ද්‍රව්‍ය (බීජ හා වර්ධක කොටස්) සිටුවා ප්‍රරෝහණයට හා පැළ වර්ධනයට හිතකර පරිසරයක් ලබාදෙමින් ක්ෂේත්‍රයේ සිටුවීමට සුදුසු තත්ත්වයට පත්වන තෙක් රැක බලාගනු ලබන තාවකාලික ස්ථානයයි.

*තවාන්වල අවශ්‍යතාව*

- නිරෝගී හා ශක්තිමත් පැළ වැඩි සංඛ්‍යාවක් නිපදවා ගැනීම.
- ක්ෂේත්‍රයේ කෙළින්ම සිටුවීමට අපහසු කුඩා බීජවලින් පැළ නිපදවා ගත හැකිවීම (තක්කාලි, බටු)
- පහසුවෙන් රැකබලාගැනීම.
- ඒකාකාරී වගාවක්
- ග්‍රාහක පැළ ලබාගැනීම ආදිය




*තවාන් සැකසීමේ පියවර*

1. සුදුසු ස්ථානයක් තෝරාගැනීම.
2. තවාන් මිශ්‍රණය සහ තවාන සැකසීම.
3. තවාන් ජීවානුහරණය කිරීම.
4. රෝපණ ද්‍රව්‍ය සංස්ථාපනය

*සුදුසු ස්ථානයක් තේරීම*

- හිරු එළිය හොඳින් ලැබීම.
- ජලය ලබාගැනීමේ පහසුව
- සමතලා බිමක් වීම.
- ජල වහනය හොඳින් සිදුවීම.
- අධික සුළං නොමැතිවීම.
- ප්‍රවාහන පහසුකම් තිබීම.
- රෝගී වගාවක් නොතිබුණු ස්ථානයක් වීම.
- නිතරම අවධානය යොමු කළ හැකි ස්ථානයක් වීම.

තවාන් පාත්තියක සම්මත පළල මීටර් 01කි.

*තවාන් ජීවානුහරණය*

- සූර්ය තාපය මගින්
- පිළිස්සීම මගින් (මෙහි නිවැරදි ක්‍රමය පිළිබඳ අවධානය යොමු කරන්න.)
- උණු ජලය මගින්
- රසායනික ද්‍රව්‍ය මගින්

*තවාන් නඩත්තු කිරීම*

- වසුන් යෙදීම සහ ඉවත් කිරීම.
- ජල සම්පාදනය
- සෙවණ සැපයීම.
- වල් මර්දනය
- පොහොර යෙදීම.
- රෝග හා පලිබෝධ පාලනය
- පැළ දැඩි කිරීම.
- පැළ ගැලවීම.

## නිපුණතාවය 07 - බෝග වගාවේ ජල කළමනාකරණය

*බෝග වගාවට ජලයේ ඇති වැදගත්කම*

- ප්‍රභාසංස්ලේෂණය ඇතුලු කායික ක්‍රියා
- බීජ ප්‍රරෝහණයට
- බීජ පැළ සිටුවීම සඳහා
- සමහර බීජවල ව්‍යාප්තිය සඳහා
- පෝෂක අවශෝෂණය සඳහා
- බිම් සැකසීම.
- වී වගාවේ වල් පැළ පාලනය

*පසෙහි ජලය ඉවත්වන ක්‍රම*

- උත්ස්වේදනය
- වාෂ්පීකරණය
- පෘෂ්ඨීය අපද්‍රවය
- වැස්සීම

*පාංශු ජල සංරක්ෂණ ක්‍රම*

- පසට කාබනික ද්‍රව්‍ය එකතු කිරීම.
- පසට ස්වභාවික හෝ කෘත්‍රිම වසුන් යෙදීම.
- වල් පැළෑටි ඉවත් කිරීම.
- මතුපිටින් ගලායන ජලය රඳවා ගැනීම (සමෝච්ච ගල්වැටි, හෙල්මළු ආදී ක්‍රම මගින්)
- පළතුරු සහ විසිතුරු ශාක කප්පාදු කිරීම.

*ජල සම්පාදනය යනු,*

කිසියම් ක්ෂේත්‍රයකට වර්ෂාව නොමැති වූ විට බෝගවලට අවශ්‍ය ජලය ජල මූලාශ්‍රයකින් අමතරව සැපයීම.

බෝග වගාව සඳහා සුදුසුම ජල තත්ත්වය වන්නේ ක්ෂේත්‍ර ධාරිතාවයයි.

ජල සම්පාදනයේදී වැදගත් වන්නේ පස වියළී ස්ථිර මැලවීමේ සංගුණකයට පත්වීමට පෙර නැවත ජලය යොදා ක්ෂේත්‍ර ධාරිතාවයට ගෙනඒමයි.

*ජල සම්පාදනයේදී සැලකිය යුතු කරුණු*

- වගාකර ඇති බෝගය
- බෝගයේ වර්ධන අවස්ථා
- ජලය සැපයීමේ අරමුණු
- පසේ වයනය

ජල සම්පාදන ක්‍රම

- පෘෂ්ඨීය භූතල/ මතුපිට ජල සම්පාදනය
  - පිටාර ජල සම්පාදනය
  - තීරු ජල සම්පාදනය
  - බේසම් ජල සම්පාදනය
  - ඇළි හා වැටි ජල සම්පාදනය
- උපපෘෂ්ඨීය භූගත/ ජල සම්පාදනය
  - මැටි කළ වැළලීම
    - සවිවර නළ
- ඉසින ජල සම්පාදනය
- බිංදු (ක්ෂුද්‍ර) ජල සම්පාදනය

*පිටාර ජල සම්පාදනය*

| වාසි | අවාසි |
|---|---|
| • මූලික වියදම අඩු ය. | • පස මඩවීම. |
| • වල් පැළ මර්දනය | • වල් පැළ සහ රෝග ව්‍යාප්ත වේ. |
| • ලවණතාව ඉවත් කළ හැකිවීම. | • උපකරණ භාවිතය අපහසු වීම. |
| • විශේෂ තාක්ෂණික දැනුමක් අවශ්‍ය නොවේ. | • ජලය අපතේ යෑම. |
| | • වැඩි ජල ප්‍රමාණයක් අවශ්‍ය වීම. |
| | • වැලි පසට යෝග්‍ය නොවීම. |

*ඉසින ජල සම්පාදනය*

| වාසි | අවාසි |
|---|---|
| • මුළු ශාකයටම ජලය ලැබේ. | • වියදම වැඩිවීම. |
| • බෑවුම් සහිත ඉඩම්වලට සුදුසු වීම. | • තාක්ෂණික දැනුම අවශ්‍ය වීම. |
| • ඛාදනය සිදු නොවීම. | • බලශක්තිය අවශ්‍ය වීම. |
| • අවශ්‍ය ජල ප්‍රමාණය අඩු ය. | • උස් බෝග වගාව සඳහා නුසුදුසු වීම. |
| • පොහොර මෙන්ම කෘෂි රසායන ද්‍රව්‍ය යෙදිය හැකිවීම. | • නළ පද්ධතිය අවහිරවිය හැකිවීම. |
| | • පශ්චාත් සාත්තු අපහසු ය. |
| | • පරාගනයට බාධා ඇතිවිය හැකිවීම. |

*ජලවහනය යනු,*

වගා බිමේ ඇති අතිරික්ත ජලය හෙවත් ක්ෂේත්‍ර ධාරිතාවයට වැඩියෙන් ඇති ජලය ක්ෂේත්‍රයෙන් ඉවත් කිරීමයි.

*ජලවහන ක්‍රම*

- භූතල ජලවහනය
- භූගත ජලවහනය
- ජල පොම්ප මගින් සහ වෙනත් ක්‍රම

*ජලවහන පද්ධති*

- හෙරින් බොන් ක්‍රමය
- ග්‍රිඩ් අයන් ක්‍රමය
- සමාන්තර ක්‍රමය

*දුර්වල ජලවහනය සමග ඇතිවන ගැටලු*

- පාංශු වාතය දුර්වල වීම.
- කාබනික ද්‍රව්‍ය කුණුවීම නිසා විෂ වායු ඇතිවීම.
- මුල්වල ශ්වසනයට ඔක්සිජන් නොලැබීම.
- කෘෂි උපකරණ භාවිතය අපහසු වීම.
- ශාක මුල්වල දිලීර රෝග ඇතිවීම.

## නිපුණතාවය 08 - ශාක පෝෂණය

*ශාකයකට අත්‍යවශ්‍ය පෝෂක වර්ග දෙකකි.*

- මහා පෝෂක (වැඩි ප්‍රමාණවලින් ශාකයට අවශ්‍ය වේ)
- ක්ෂුද්‍ර පෝෂක (අඩු ප්‍රමාණවලින් ශාකයට අවශ්‍ය වේ)

*මහා පෝෂක (09)*

- C කාබන් - වායුගෝලයෙන්
- H හයිඩ්‍රජන් - ජලයෙන්
- O ඔක්සිජන් - වායුගෝලයෙන් සහ පසෙන්
- N නයිට්‍රජන්
- P පොස්පරස්
- K පොටැසියම්
- Ca කැල්සියම්
- Mg මැග්නීසියම්
- S සල්ෆර්

(N, P, K, Ca, Mg, S) — පසෙන්

*ක්ෂුද්‍ර පෝෂක (07)*

- Zn සින්ක්
- Cu කොපර්
- Mn මැංගනීස්
- Mo මොලිබ්ඩිනම්
- B බෝරෝන්
- Fe යකඩ
- Cl ක්ලෝරීන්

*නයිට්‍රජන් ඌණතා ලක්ෂණ*

- මේරූ පත්‍ර කහ පැහැවීම.
- ශාක වර්ධනය අඩු වී ශාක කුරුවීම.
- මල් ඵල සහ ඵල විකෘති වේ.
- අස්වැන්න අඩු වේ.

*පොස්පරස් ඌණතා ලක්ෂණ*

- ශාකයේ වර්ධනය බාල වේ.
- පත්‍ර පහසුවෙන් හැලේ.
- මුල් සංඛ්‍යාව අඩු වී වර්ධනය බාල වේ.
- සමහර ශාකවල මේරූ පත්‍ර දම් පැහැවීම.

*පොටෑසියම් ඌණතා ලක්ෂණ*

- පත්‍ර දාර කහ පැහැවීම.
- පසුව පත්‍ර දාර කහ පැහැවීම.

*පොහොර ප්‍රධාන කොටස් 02*

- කාබනික පොහොර
- රසායනික පොහොර

*කාබනික පොහොර වර්ග*

- කොළ පොහොර
- සත්ව පොහොර
- කොම්පෝස්ට් පොහොර
- දියර පොහොර

*කාබනික පොහොරවල ඇති වැදගත්කම*

- පූර්ණ පොහොර මිශ්‍රණයකි.
- කැටායන හුවමාරු ධාරිතාව වැඩිවීම.
- පාංශු ව්‍යුහය හා ජල අවශෝෂණ ධාරිතාව වැඩවීම.
- පාංශු ක්ෂුද්‍ර ජීවී ගහණය වැඩිවීම.
- PH අගය නොවෙනස්ව තබාගනියි.

*පොහොර කාර්යක්ෂමතාව යනු,*

පසට යොදන පොහොර බෝග විසින් ප්‍රයෝජනයට ගැනීමේ හැකියාවයි.

*ඒකාබද්ධ ශාක පෝෂක කළමනාකරණය යනු,*

කාබනික පොහොර යොදා පසෙහි භෞතික, රසායනික සහ ජෛව ලක්ෂණ සංවර්ධනය කරගනිමින් බෝගයේ පෝෂණ අවශ්‍යතාව සපිරෙන පරිදි රසායනික පොහොර යෙදීම.

*රසායනික පොහොර භාවිතය*

| වාසි | අවාසි |
|---|---|
| • ඉක්මණින් ශාකවලට අවශෝෂණය වේ. | • PH අගය වෙනස් විය හැකිවීම (ක්ෂේත්‍රයේදී) |
| • ඌණතා අනුව යෙදිය හැකිවීම. | • නිර්දේශිත ප්‍රමාණවලට වැඩියෙන් යෙදුවහොත් ශාක මියයෑම. |
| • ක්ෂේත්‍රයට යෙදීම පහසුවීම. | • සමහර පොහොර ගබඩාවලදී දියවිය හැකිවීම. |
| • ගබඩා කිරීමට අඩු ඉඩක් අවශ්‍ය වීම. | • වැඩිපුර යෙදීමෙන් ජල ප්‍රභව දූෂණය වීම. |
| • ප්‍රවාහනය පහසුවීම. | |

## නිපුණතාවය 09 - පළිබෝධ පාලනය

*බෝග වගාවේ පළිබෝධ වර්ගීකරණ*

වල් පැළෑටි　　　රෝගකාරක ජීවීන්　　　කෘමීන් සහ කෘමි නොවන සතුන්

*වල් පැළෑටි යනු,*

වගා කරන ලද බෝගයට අමතරව එම වගාබිමේ වැඩෙන ඕනෑම පැළෑටියක් වල් පැළෑටියක් නම් වේ. (උදා. බටු පාත්තියක ඉබේ වැවෙන මිරිස් වල් පැළෑටියකි)

*ආක්‍රමණශීලී වල් පැළෑටි යනු,*

ශීඝ්‍ර වර්ධනයක් සහිත, දේශීය ශාක ප්‍රජාවට තර්ජනයක් වන විදේශීය පැළෑටි ආක්‍රමණශීලී වල් පැළෑටි නම් වේ. (උදා. ගඳපාන, පාසිනියම්, විබේලියා)

*වල් පැළෑටි වර්ගකීරණය*

- රූපාකාරය අනුව
- ජීවිත කාලය අනුව
- වැඩෙන ස්ථානය අනුව

*වල් පැළෑටි පාලන උපාය මාර්ග*

- වගාබිමේ වල් පැළෑටි බෝගයට හානිකර මට්ටමට අඩුවෙන් පවත්වාගැනීම.
- වගාබිමේ අලුතින් වල් පැළෑටි ඇතුල්වීම වළක්වා ගැනීම.

*වල් පැළ ඇතුලු පළිබෝධ පාලන ක්‍රම*

- ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රම
- යාන්ත්‍රික ක්‍රම
- ජෛව විද්‍යාත්මක ක්‍රම
- රසායනික ක්‍රම
- ව්‍යවස්ථාපිත ක්‍රම

*රසායනික වල් පැළෑටි වර්ගීකරණය* - වල් නාශක යෙදිය යුතු අවස්ථාව අනුව. මෙහි කොටස් දෙකකි.

- පූර්ව නිර්ගමන වල් පැළෑටි නාශක
- පශ්චාත් නිර්ගමන වල් පැළෑටි නාශක

*ශාක රෝග යනු,*


ශාකයකට පීඩාකාරී වන අසාමාන්‍ය කායික ක්‍රියාදාමයයි. උදා. පෝෂණ ඌණතා, මූලද්‍රව්‍ය විෂවීම, අහිතකර දේශගුණික සාධක

*රෝගකාරක ජීවීන්*

දිලීර, බැක්ටීරියා, වෛරස්, වටපණු, පයිටොප්ලාස්මා

*රෝග ත්‍රිකෝණය*

ශාකයකට රෝගයක් වැළඳීමට සම්පූර්ණ විය යුතු සාධක තුනකි. එම සාධක තුනෙහි අන්තර් සබඳතාව ඉතා වැදගත් වේ. මෙම සබඳතාව රෝග ත්‍රිකෝණයෙන් පෙන්නුම් කෙරේ.




*බහුලව දක්නට ලැබෙන ශාක රෝග*

- දිලීර රෝග - දියමලන් කෑම, ඇන්ත්‍රැක්නෝස්
- බැක්ටීරියා රෝග හිටු මැරීම
- වෛරස් රෝග - පණු විචිත්‍ර රෝගය, කෙසෙල් වඳ පීදීම
- වටපණු රෝග - මුල්ගැට රෝගය

## නිපුණතාවය 10 - වී වගාව

*ශ්‍රී ලංකාවේ වී වගාවට ඇති විභව*

- නුවරඑළිය දිස්ත්‍රික්කයේ සුළු කොටසක් හැර ශ්‍රී ලංකාවේ සෑම ප්‍රදේශයකට වී වගා කිරීම.
- වී වගාවට අදාළ පර්යේෂණ සහ අභිජනන මධ්‍යස්ථාන ප්‍රාදේශීය මට්ටමෙන් පිහිටුවා තිබීම.
- විවිධ දේශගුණික හා පාංශු කාණ්ඩවලට ගැලපෙන වී ප්‍රභේද රාශියක් තිබීම.

*වී වගාවට ලැබෙන රාජ්‍ය අනුග්‍රහය*

- පොහොර සහනාධාරය
- වගා රක්ෂණ ක්‍රම
- සහතික මිල ක්‍රමය
- වගා ණය
- ගොවි විශ්‍රාම වැටුප්

*වී ප්‍රභේද*

- පාරම්පරික වී ප්‍රභේද. උදා. මඩතවාලු, කුරුළුතුඩ, සුවඳැල්, පච්ච පෙරුමාල්
- නව වී ප්‍රභේද. උදා. BG 300, PW 351, BG 450

*පාරම්පරික වී ප්‍රභේද සහ වැඩිදියුණු කළ වී ප්‍රභේදවල ලක්ෂණ*

| **පාරම්පරික වී ප්‍රභේද** | **වැඩිදියුණු කළ වී ප්‍රභේද** |
|---|---|
| • ශාකය උසින් වැඩි ය. | • ශාකය මිටි ය. |
| • ශාකය ඇද වැටේ. | • ශාක ඇද වැටීමට ඔරොත්තු දෙයි. |
| • පත්‍ර සිහින් ය. | • පත්‍ර කෙටි ය. |
| • පඳුරු දැමීම අඩු ය. | • පඳුරු දැමීම වැඩි ය. |
| • පළිබෝධ හානිය අඩු ය. | • පලිබෝධ හානිය වැඩි ය. |
| • අස්වනු අඩු ය. | • අස්වනු වැඩි ය. |

*වී ක්ෂේත්‍ර සංස්ථාපනය*

- බීජ කෙළින්ම ක්ෂේත්‍රයට යෙදීම (වැපිරීම)
  - බීජ පේළියට දැමීම (බීජ වප්කර මගින්)
  - බීජ ක්ෂේත්‍රයේ වැපිරීම (අතින්)
- බීජ තවාන් කර පැළ සිටුවීම
  - නිසි පරතරයක් ඇතිව පේළියට සිටුවීම
  - නිසි පරතරයක් නොමැතිව පැළ සිටුවීම

*බිත්තර වීවල තිබිය යුතු ප්‍රමිති*

- පැළවීමේ ශක්තිය 85%
- තෙතමනය 13%
- පවිත්‍රතාව 98%
- උපරිම වල් පැළෑටි සංඛ්‍යාව (500g) 5

*තවාන් වර්ග*

- ඩැපොග් තවාන
- මඩ තවාන
- තැටි තවාන

*වී වගාවේ රෝග*

- කොළ පාලුව
- කොපු අංගමාරය
- බැක්ටීරියා කොළ අංගමාරය

*වී වගාවේ කෘමි හානි*

- පැළමැක්කා
- කීඩෑවා
- පුරුක් පණුවා
- ගොක් මැස්සා
- ගොඩවෙල්ලා